**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රොෂාන් රණසිංහ (පා.ම.)**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය

2022 දෙසැම්බර් මස .......... වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත 2016.10.27 හා අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග, ක්‍රීඩාවේ, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා ක්‍රීඩාවේ නියැලෙන්නන්ගේ අභිවෘද්ධිය, දියුණුව සහ සංවර්ධනය වෙනුවෙන් පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1) ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල II වන කොටසේ 5(1) නියෝගය එකී නියෝගයේ;

“ තම ව්‍යවස්ථාවේ දක්වා ඇති නිලධරයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වන කමිටුවක් තෝරා පත්කර ගත යුතු ය” යන වචන වෙනුවට “තම ව්‍යවස්ථාවේ දක්වා ඇති නිලධරයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වන සහ ධුර කාලයේ උපරිම ය, වසර දෙකක් (02) ක් විය යුතු වන විධායක කමිටුවක් තෝරා පත්කර ගත යුතු ය” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2) එකී නියෝගවල 5(2) නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත නියෝගය ආදේශ කරමින් එකී නියෝගය තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(i) කමිටුවේ සෑම නිලධරයෙකුම නිලවරණය පවත්වන මහා සභා රැස්වීමේ දී තෝරා පත් කර ගනු ලැබිය යුතු ය;

(ii) කිසියම් නිලධරයෙකු;

(අ) ධුර කාල දෙකක් (වසර 04ක්) සභාපති ධුරය දරා ඇත්නම්, නැවත සභාපති ධුරයට තේරී පත්වීමට නුසුදුස්සකු විය යුතු ය. එසේ වුවද, තවත් වසර හතරක (04) කාලයක් කමිටු සාමාජිකත්වය දැරීමට එය බාධාවක් නොවිය යුතු ය.

(ආ) ධුර කාල හතරක් (04) (වසර අටක (08) ධුර කාලයක් ) ධුර දරා ඇත්නම්, නැවත තේරී පත්වීමට නුසුදුස්සකු විය යුතු අතර කමිටු සාමාජිකත්වය දැරීමට ද නුසුදුස්සකු විය යුතු ය.

එසේ වුවද, මෙම නියෝග බලාත්මක වන දින වන විට නිලවරණයෙන් තේරී පත්වී ඇති සභාපති ඇතුලු අනෙකුත් ධුරධාරීන් සම්බන්ධයෙන් ඔවුන් තේරී පත්ව ඇති ධුර කාලය අවසන් වන තෙක්, එකී ධුර දැරීමට මෙම නියෝගය බාධාවක් නොවිය යුතු ය.

(iii) කිසියම් කමිටු සමාජිකයෙකුට කමිටු සාමාජිකත්වය දැරිය හැකි උපරිම කාල සීමාව ධුර කාල 4ක් (වසර 08ක්) විය යුතු ය.

එසේ වුවද, කිසියම් නිලධාරියෙකු හෝ කමිටු සාමාජිකයෙකු ක්‍රීඩා පනත හා ඒ යටතේ පත් කරන ලද යම් පිළිගත් කමිටුවක් විසින් පවත්වන ලද විධිමත් පරීක්ෂණයක් මගින් හෝ; අදාළ ජාත්‍යන්තර සංගමය හෝ ඊට අනුබද්ධ ජාත්‍යන්තර සංගමයක් විසින් හෝ විනය හේතු මත හෝ;

ඉවත් කරනු ලැබුවේ නම් හෝ දඬුවමකට ලක් කරනු ලැබුවේ නම් හෝ තහනමකට ලක් කරනු ලැබුවේ නම් එකී ඉවත් කිරීම, දඬුවමකට ලක් කිරීම හෝ තහනමට ලක් කරන ලද අයෙකුට එකී ධුරයට හෝ කමිටු සාමාජිකත්වයට නැවත තෝරා පත් කර ගැනීමට නුසුදුස්සකු වන්නේ ය.

(iv) සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු ඕනෑම විධායක කමිටු සාමාජිකයකු, ක්‍රීඩා පනත, රෙගුලාසි, විධාන හා එකී ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන අවස්ථාවක අදාළ සංගමයේ /සම්මේලනයේ ඡන්ද හිමි සාමාජිකයකු විසින් ඡන්ද හිමි සාමාජිකයින්ගේ සරල බහුතරයකින් ගෙනෙන යෝජනාවක් විශේෂ මහා සභාවක් කැඳවීමෙන් හෝ මහා සභා රැස්වීමකදී, සංගමයේ/ සම්මේලනයේ ඡන්ද හිමි සාමාජිකයින්ගේ 2/3ක බහුතරයෙන් සම්මත කර ගැනීමෙන්, අදාළ ධුර කාලය සම්පූර්ණ වීමට පෙර වුව ද ධුරයෙන් ඉවත් කිරීමට හැකිවන්නේ ය.

(v) ඕනෑම නිලධාරියෙකුගේ හෝ කමිටු සාමාජිකයකුගේ එකී ධුර කාලය දැරිය හැකි උපරිම වයස් සීමාව වයස අවුරුදු හැත්තෑව (70) දක්වා සීමා කරනු ලබන්නේ ය.

03) එකී නියෝගවල 5 (1) වැනි නියෝගයේ, (iii) (අ), (iii) (ආ), (iii) (ඇ) සහ (iv) යන ජේද ඉවත් කර, ඒ වෙනුවට පහත ජේදය ආදේශ කිරීමෙන් එකී නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(iii) (අ) A හා B ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක් සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයෙකු හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සහතික ලත් වරලත් ගණකාධිකාරී හෝ ඊට ඉහළ සහතිකයක් ලබා ඇති හෝ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද බැංකුකරණ හා මූල්‍ය පිළිබඳ සහතිකයක් ලබා ඇති හෝ භාණ්ඩාගාරිකවරයකු ද මූල්‍ය කළමණාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ඇති සහකාර භාණ්ඩාගාරිකවරයකු ද,

(ආ) C ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගමයක් සඳහා 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂ බැංකුවක හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් මුදල් සමාගමක හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වූ ලියාපදිංචි කරන ලද, කල්බදු මූල්‍යකරණ ආයතනයක හෝ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාපිත සමාගමක ගිණුම් කළමණාකරුවකු හෝ ගිණුම් ලිපිකරුවකු ලෙස අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද ඇති භාණ්ඩාගාරවරයකු ද මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ඇති සහකාර භාණ්ඩාගාරිකවරයකු ද,

4) එකී නියෝගවල 5 (4) (ඕ) ජේදය ඉවත් කර පහත ජේදය ආදේශ කිරීමෙන් එකී නියෝගය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

5 (4) (ඕ ) "ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වුවහොත් සහ ද්විත්ව පුරවැසියෙකු වන්නේ නම්"

5) එකී නියෝගවල 5 (4) (ග) ජේදයට ඉක්බිතිව ම 5 (4) (ච) ජේදය ඇතුළත් කිරීමෙන් එකී නියෝගය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

5 (4) (ච) ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ සේවයේ නියුතු හෝ ක්‍රීඩා විෂයට අදාළ රාජකාරියක නියුතු රාජ්‍ය සේවකයකු වේ නම්,

6) එකී නියෝගවල 5 (4) (බ) ජේදයට ඉක්බිතිව ම පහත ජේද ඇතුළත් කිරීමෙන් එකී නියෝගය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

5 (4) (ම) නාම යෝජනා භාර දීමට ආසන්න වසර තුන (03) ඇතුළත වත්කම් බැරකම් ප්‍රකාශ නිලවරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්,

5 (4) (ය) මූල්‍ය හෝ වෙනත් ආධාර අවභාවිතයකට හෝ දූෂණයට හෝ අක්‍රමිකතාවකට හෝ ක්‍රීඩාවේ විනය හෝ සංගම් ව්‍යවස්ථාවේ විනය කඩ කිරීම සම්බන්ධයෙන් තහනමකට ලක්වන ක්‍රියාවකට හෝ වෙනත් නීත්‍යානුකූල නොවන කාරණයක් සම්බන්ධයෙන් ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් විධිමත් පරිදි පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයකින්, විමර්ශන කමිටුවකින්, අභියාචනා උපදේශක මණ්ඩලයකින්, ක්‍රීඩා පිලිබඳ වැරදි වැලැක්වීමේ පොලිස් විශේෂ විමර්ශන ඒකකයෙන් හෝ පාර්ලිමේන්තු කෝප් කමිටුවේ හෝ නිර්දේශයකින් එකී චෝදනා සම්බන්ධයෙන් වැරදිකරුවෙකු ලෙස හෝ ජාතික ක්‍රීඩා සංගමයක / සම්මේලනයක / කමිටුවක නිල ධූරයක් දැරීමට නුසුදුස්සෙකු බවට නිර්දේශයක් ලබා ඇති තැනැත්තෙකු වන්නේ නම්,

7) එකී නියෝගවල 5 (5) නියෝගයට ඉක්බිතිවම පහත ඡේදය එකතු කිරීමෙන් එකී නියෝගය තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

5 (5) (i) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය යටතේ සමාජයට, ක්‍රීඩාවට සුවිශේෂී සේවයක් කළ හා රජයට සුවිශේෂී ආදායම් බදු ගෙවන පුද්ගලයෙකු ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක නිලයක් දැරීමට සුදුස්සෙකු වන්නේ ය.

8) එකී නියෝගවල 5 (6) නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත නියෝගය ආදේශ කිරීමෙන් එකී නියෝගය  මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5 (6)

ජාතික ක්‍රීඩා සංගමයක, පළාත්  ක්‍රීඩා සංගමයක, දිස්ත්‍රික් ක්‍රීඩා සංගමයක හෝ අනුබද්ධ ක්‍රීඩා සමාජයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප/නියෝජ්‍ය සභාපති, උප/නියෝජ්‍ය ලේකම්, උප/නියෝජ්‍ය භාණ්ඩාගාරික යන ධූරයක් දරන යම් තැනැත්තෙකු තම ජාතික ක්‍රීඩා සංගමයේ හෝ වෙනත් යම් ජාතික ක්‍රීඩා සංගමයක,  පළාත් ක්‍රීඩා සංගමයක, දිස්ත්‍රික් ක්‍රීඩා සංගමයක ප්‍රාදේශිය ක්‍රීඩා සාමාජයක  හෝ අනුබද්ධ ක්‍රීඩා සමාජයක හෝ වෙනත් කිසිදු ජාතික ක්‍රීඩා සංගමයක කිසිදු ධූරයක් දැරීමට නුසුදුස්සකු වන්නේ ය.

9) තවද ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල III වන කොටසේ 7  වන නියෝගයේ (xxvi)  ඡේදයට ඉක්බිතිව ම පහත ඡේදය අලුතෙන් එකතු කිරීමෙන් එකී නියෝග තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

7  (xxvii)

ජාතික ක්‍රීඩා සංගමයකට/ සම්මේලනයකට අනුබද්ධ ක්‍රීඩා සමාජ, ආයතන, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්, පළාත් ක්‍රීඩා සංගම් හෝ දිස්ත්‍රික් හෝ පළාත් සංගමයකට අනුබද්ධ ක්‍රීඩා සමාජ හා අනුබද්ධ සාමාජික සංවිධානවල නිලවරණයන් ඇතුළු සියලු ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් තොරතුරු

අදාළ ජාතික ක්‍රීඩා සංගමය/ සම්මේලනය විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු ය.

10) ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල III වන කොටසට ඉක්බිතිවම

'III (අ) වන කොටස' ලෙස නව කොටසක් එකතු කරමින් ද එය ' ක්‍රීඩා සංගම් අධීක්ෂණය' ලෙස නම් කරමින්ද, ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල III (අ) වන කොටසේ 7 (අ) වන නියෝගය ලෙස පහත නියෝගය අලුතින් එකතු කරමින්ද, එකී නියෝගය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

7 (අ) ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉහත සඳහන් සියළු ක්‍රීඩා සංගම්, සමාජ හා අනුබද්ධ ආයතන පිළිබඳ පූර්ණ අධීක්ෂණයක් සිදු කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

තව ද;

ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් අධීක්ෂණය ඒ ඒ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා අධ්‍යක්ෂකවරයා මගින් සිදු කළ යුතුය.

ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පළාත් ක්‍රීඩා සංගම් අධීක්ෂණය ඒ ඒ පළාතේ ක්‍රීඩා අධ්‍යක්ෂකවරයා මගින් සිදු කළ යුතු අතර, එකී අධීක්ෂණ කටයුතු ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියට අනුකූල වන සේ ඒ ඒ පළාත් සභාව විසින් ප්‍රඥප්ති මගින් හඳුන්වා දී ඇති විධි විධාන ප්‍රකාරව සිදු කළ යුතුය.